## 2017 නොවැම්බර් මස සාංඝික පවුල් දින සුපුවත
## "දේව රාජ්‍යය පිළිබඳ සුබ අස්න සඳහා
## මා සාක්ෂි දැරිය යුතුය. මා එවන ලද්දේ ඒ සඳහාය."

(ශු.ලූක් 4:43)

01. ප්‍රශංසාව සඳහා :

* **"සකල ජාතිනී සමිඳුන්ට ප්‍රශංසා කරන්න. සව්සතුනි හිමිතුම ගුණ මහිමය වර්ණනා කරන්න. මන්ද අප කෙරෙහි සමිඳාණන්ගේ ප්‍රේමය ඉමහත්ය. එතුමන්ගේ විශ්වාසකම සදහටම පවත්නේය. සමිඳුන්ට ප්‍රශංසා කරන්න"** (ගීතා.117:1-2).
* දෙවි සමිඳාණන් වහන්සේ ලොවේ විවිධ ජාතීන් අතරින් පුද්ගලයන් තෝරා කැඳවනු ලබයි. එසේ කරනුයේ ඔවුන් වහන්සේ මගින් මිනිසාට ගැළවීම උදා කොට දේව ජනතාව වීමටය.
* කිතුනුවෙකු වීම යනු දේව පුත්‍රභාවයට ඇතුළුවීමයි. දේව පුත්‍රභාවය නමැති අනන්‍යතාවයට හිමි කරුවෙකු වීමයි. මෙසේ දෙවියන් වහන්සේ විසින් අප තෝරා ගනු ලැබීම කෙතරම් වාසනාවක්ද? වරප්‍රසාදයක්ද?
* මහෝත්තම වූ දෙවියනි, ඔබ වහන්සේ ඉදිරියේ දේව රාජ්‍යය උදෙසා සේවය කරන්නට අප සුදුස්සන් කිරීම ගැන ඔබ වහන්සේට අපි තුති පුදමු.
* පුබුදු ගී 95 "ඔබ තෝරා ගත්...."

02. ඔක්තෝබර් මස සාංඝික පවුල් දින සුපුවත පිළිබඳව ආපසු බැලීම :

i කිතු දන පුබුදුව ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ නමැති දර්ශණය මුල් කරගෙන ගමනක යෙදෙමින් සිටී. පුබුදු ජීවිතය ගමනකි. පසුගිය මස සුපුවත තුළින් අපි පුබුදු දැක්ම පිළිබඳව කථා බහ කළෙමු. එය කිතු දන පුබුදුවේ අනන්‍යතාවයයි.

ii එසේම යාච්ඤා ජීවිතයේ මුදුන් මල්කඩ වන යාච්ඤාවේ ගමන පිළිබඳව මෙනෙහි කළෙමු. ජීවමාන ක්‍රිස්තුන් වහන්සේව හමුවීමේ උත්තරීතර අත්දැකීම මුල් කරගෙන අපගේ ජීවිත තුළ මෙන්ම යාච්ඤා ජීවිතයේ පෙරළිය සිදු වූ අයුරු දුටුවෙමු. යාච්ඤාවේ අත්දැකීම තුළ එදා සහ අද අප සිටින තත්ත්වය අපි දුටුවෙමු.

iii ගමනේ සුවිශේෂත්වය වන්නේ, සෑම මොහොතකදීම අප සිටින තැන සිට සිටිය යුතු තැනට, අවදිවීමේ තෑග්ග හරහා ශුද්ධාත්මයාණන් වහන්සේ අපව රැගෙන යාමයි. එහෙයින් ගැඹුරු සාමයක්, ප්‍රීතියක්, නිදහසක් අත්දකින, භුක්ති විඳින ගමනක් මෙන්ම, මොහොතින් මොහොත අප තුළ දේව පුත්‍රභාවය ජනිත කරන්නීය. අහිතකර ලෙස අපට බලපාන සිදුවීම් සක්‍රමේන්තු තත්ත්වය ඔවුන් වහන්සේ තුළ එසවනවා මෙන්ම ආලෝකවත් දැක්මක් අප තුළ ඇති කරනු ලබයි.

03. පසුගිය සති කිපය තුළ මගේ පැයේ ගමන පිළිබඳව අත්දැකීම් කුඩා කණ්ඩායම් තුළ බෙදා ගන්න. පොදුවේ ද සාංඝික කර ගන්න.

* වචනයේ සේවකයා විසින් පළමුවෙන්ම තමාගේ අත්දැකීම බෙදා ගනිමින් සෑම දෙනෙකුටම බෙදා ගැනීම සඳහා යොමු කරන්න.
* සියළු අත්දැකීම් මුල් කරගෙන ප්‍රශංසා කරන්න.
* බලාපොරොත්තුවෙහි ප්‍රීතිවන්න, විපතේදී ඉවසිලිවත් වන්න. යාච්ඤාවෙහි නොකඩවා යෙදෙන්න. (රෝම 12:12)
* නිතරම ප්‍රීතිවන්න, නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තුති දෙන්න. කිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේගේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ. ශුද්ධාත්මයාණන් වහන්සේට අවහිර නොකරන්න.
* පුබුදු ගී අංක 73 "ප්‍රීතිවන්න සැමවිට සමිඳුන් කෙරේ...."

04 මාසික සුපුවත :

1. හැඳින්වීම:
ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණන් හා ශුද්ධවරයාණන් වන ශු.ජුසේ වාස් මුනිතුමාගේ දූත මෙහෙවර පිළිබඳ ශ්‍රී ලාංකික අපි සමිඳාණන් වහන්සේට තුති පැසසුම් පුද කළ යුතුය. මන්ද, ඔවුන් වහන්සේ එතුමා මගින් අප කෙරෙහි දැක්වූ ප්‍රේමය ඉමහත්ය.

i **අප කෙරෙහි දෙවියන් වහන්සේගේ ප්‍රේමය ඉමහත්ය.**

* ජුසේ වාස් පියතුමාව යවනු ලැබූවකු මෙන් අප දිවයිනට ධර්මදූත සේවය සඳහා කැඳවනු ලැබීම දේව සුරක්ෂිතභාවයේ ප්‍රබල අත්දැකීමකි. මන්ද, එවකට ශ්‍රී ලංකාව තුළ පැවති ඕලන්ද පීඩන සමයෙහි කතෝලික ජනතාව දැඩි අසරණ තත්ත්වයකට මුහුණ පා තිබුණි. 1687 වසරේදී යාපනය අර්ධද්වීපයට පැමිණීම සඳහා ඉන්දියාවේ ගෝවේ සිට රුවල් නැවකින් පැමිණි අතර, අතරමගදී ප්‍රචණ්ඩ කුණාටුවක් ඇති වූ බැවින් ගමනට දීර්ඝ කාලයක් ගතවිය. මේ නිසා නැවේ කපිතාන්වරයා චණ්ඩ මාරුතය නිසා නැව ඒ මේ අතට පා වෙමින් තිබූ බැවින් මන්නාරමේ දින ස්වල්පයක් නතර වීමට තීරණය කරන ලදී. මේ හේතුවෙන් ජුසේ වාස් පියතුමාට හා තම සේවකයාට නැවේ සිටි මගින්ගෙන් යැපෙන්නට සිදු විය. අන්තිමේදී යාපනය බලා ගිය එතුමාට මන්නාරමේ නතර වෙන්නට සිදු විය. මන්නාරම් ප්‍රදේශය තුළ අධිකතර කතෝලික ජන සංඛ්‍යාවක් සිටින බව එතුමා දැන ගත්තේ එවිටය. ඒ වන විට මන්නාරමේ කතෝලික ජනතාවද දැඩි පීඩාකාරී තත්ත්වයකට මුහුණපා සිටියහ. ජුසේ වාස් පියතුමා දින ගණනාවක් මන්නාරමේ රැඳෙමින් නිවසින් නිවසට යමින්, කතෝලිකයන් හඳුනා ගෙන ඇත.

* ඉහත වාර්තාවට සවන් දෙනවිට ශුද්ධාත්මයාණන් වහන්සේ එතුමාට මඟපෙන්වා තිබූ ආකාරය හා මෙහෙයවන ලද ආකාරය පිළිබඳව ළඟ සිටින කෙනා සමඟ බෙදා ගන්න.

ii **එවකට ශ්‍රී ලංකාව තුළ පැවති තත්ත්වය :**

* එවකට ලන්දේසීන් ලැගුම් ගෙන සිටි ප්‍රදේශවල ජීවත් වූ රට වැසියන්ගෙන් වැඩි සංඛ්‍යාවක් කතෝලිකයන් විය. ඔවුන්ගේ අරමුණ වූයේ කතෝලික විශ්වාසය මුලින් උපුටා දැමීමය. දිවයිනේ සියළුම දේවස්ථාන, විදුහල් ඔවුන් විසින් පැහැර ගනු ලැබීය. ඒවා ගිනිබත් කොට පොළොවට සමතලා කොට දූෂිත අදේවවාදී කටයුතු සඳහා යෙදවීය. ලන්දේසි දේවස්ථානවල වන්දනාවට සහභාගි වීමට ද බෞතීස්මය, විවාහ හා අවමංගල්‍ය කටයුතු පවා ඔවුන්ගේ ආගමික චාරිත්‍ර අනුව ඉටු කිරීමට ද ඔවුන් කියන පරිදි පාසැල්වලට දරුවන් ඇතුළු කිරීමට ද බලකර සිටියහ. එහි ප්‍රතිපලය වූයේ කතෝලිකයන් බොහෝ දෙනෙක් ක්‍රමක් ක්‍රමයෙන් තම ඇදහිල්ල හැර දැමීමයි. දුර්වල කර ගැනීමයි. මන්ද, ඔවුන්ගේ දිළිඳුබව හා ලාභ ප්‍රයෝජනය නිසා පීඩිතයන්ගේ දහමට අවනත වීමට සිදු විය. මේ හේතුවෙන් කතෝලික විශ්වාසය අහිමි කර ගැනීමේ අනතුරකට ජනතාව මුහුණ පා සිටියහ.

* මෙවැනි දැඩි අසරණ තත්ත්වයකට මුහුණ පෑ සිටි ජනතාවගේ හදවතේ මොර ගැසීමට සමිඳාණන් වහන්සේ සවන් දී ඔවුන්ට දිව්‍ය සංරක්ෂණය ලබා දුන් අයුරු බෙදා ගන්න.

iii **ජුසේ වාස් පියතුමාගේ දූත කාර්යයෙන් බිඳක් මෙනෙහි කරමු.**

* යාපන අර්ධද්වීපයට පැමිණි පසු නගරය ආසන්නයේ කුඩා මඩුවක නතර වී සිටියහ. ඒ වන විට එතුමා දුර්වලව හා අසරණව සිටි නිසා සිඟමන් ඉල්ලීමට පවා සිදු විය. එසේම උග්‍ර පාචන රෝගයට ගොදුරු විය. ඒ තත්ත්වය නිසා ජෝන් නමැති තම සේවකයාගේ සහය ලබා ගත් අතර, දේව වරප්‍රසාදය තුළ එතුමා සුවපත් වී සිඟමන් අයදිමින් කතෝලිකයන් සොයා මංමාවත්වල සැරි සරනු ලැබීය. එවකට ප්‍රදේශයේ කිසිම තැනක කුරුසියක් හෝ ප්‍රතිමාවක් හෝ ආගමික පිංතූරයක් දක්නට නොතිබිණ. එතුමා කතෝලිකයන් හඳුනා ගත්තේ පුද්ගල හැසිරීම් රටාව තුළ පමණි. එතුමා තම විශ්වාසය ප්‍රකාශ කරමින් දිගු ජපමාලයක් ගෙල පැළඳ සිටියේ සිඟමන් ඉල්ලා නිවෙස්වලට යද්දී කතෝලිකයන් ඒ සලකුණ දැක ප්‍රතිචාරය දැක්වූ ආකාරයෙන් ඔවුන් හඳුනා ගෙන ඇත.

* මෙසේ වෙස් වලාගෙන කතෝලික පියතුමෙකු දේශයට පැමිණි ඇති බව එළිදරව් විය. කල්යත්ම දිව්‍ය පූජාව පැවැත්වීම, පාපොච්ඡාරණය ඇසීම, බෞතිස්ම ස්නාපනය ලබා දීම ආදි දේව ප්‍රසාද නිධාන ජනතාවට දානය කර ඇත.

* පසු කාලෙක කිතුනු නොවන ජනතාව පවා එතුමාගේ අල්පේච්ඡ ජීවිතය අගය කර ඇත. මෙසේ එතුමා තාඩන පීඩන හිරිහැර මධ්‍යයේ අනේකාකාර දුක් පීඩා විඳිමින් ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශවලද ක්‍රිස්තු දූක කාර්යය මැනවින් ඉටු කර ඇත.

* ශු.ලූක් 4:43 **"ඔවුන් වහන්සේ කථාකොට මා වෙනත් නුවරවලද දෙවියන් වහන්සේගේ රාජ්‍යය පිළිබඳ සුභාරංචිය දේශනා කළ යුතුය. මා එවන ලද්දේ ඒ සඳහා යයි ඔවුන්ට වදාළ සේක. "**

05. මේ යුගයේ කිතු දන පුබුදුවට ලැබී ඇති කැඳවීම පිළිබඳව බෙදා ගන්න.

* ශු. ජුසේ වාස් මුනිතුමාගේ දූත මෙහෙවර අගයමින් අප දේශය පුරා ජනතාව සොයා යෑම පිළිබඳව අපගේ ක්‍රියා මාර්ග මොනවාද?
* මේ වන විට අපගේ හදවත් තුළ මෙම දිව්‍යමය කැඳවීම පිළිබඳ පිපාසයක් තිබේද?

06. අවසාන යාච්ඤාව :
සමස්ත පුබුදු ජනතාව මුල් කරගෙන සුබ අස්නට සාක්ෂි දැරීමේ පිපාසයක් ඇති කරනු සඳහා යාච්ඤා කරමු.

07. පුබුදු ගී අංක 113 "බාධක පීඩා ගැරහුම් පිළිගෙන ...."

**********************

අවධානය සඳහා :

* නොවැම්බර් මස 10 වන සිකුරාදා ප.ව.08.00 සිට 12 වන ඉරිදා දක්වා තරුණ කඳවුර ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.

* සියළුම වගකීම් ගන්නා අය සඳහා ත්‍රෛමාසික කඳවුර නොවැම්බර් මස 18 වන සෙනසුරාදා පෙ.ව.09.30 සිට 19 වන ඉරිදා දිවා ආහාරය දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ.

* පුබුදු ජාතික සුමැදි මව් රැලිය නොවැම්බර් මස 25 වන දින පෙ.ව.09.30 සිට ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ. ඔබගේ ශ්‍රාවක සංඝයන්හි සිටින සුමැදි මව්වරුන්ව එයට සම්බන්ධ කරවන්න. ඔවුන්ගේ ගමන් පහසුකම්ද සලසා දෙන මෙන් ඉල්ලා සිටිමු.

- ස්තූතියි -